**<u>ක්‍රිස්තෝත්පත්ති මංගල මහෝත්සවය</u>** | **දේව ප්‍රකාශන** | උදය දිව්‍ය පූජාව 25-12-14

**<u>පළමුවන දේව ප්‍රකාශන</u>** යෙසායා 62:11-12

යෙසායා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"අන්න, නුඹේ ගැළවුම්කාරයාණෝ උපන්නාහ."**

සමිඳුන් පොළොවේ සීමා දක්වා මෙසේ ප්‍රකාශ කර ඇත. "අන්න, නුඹේ ගැළවුම්කාරයාණෝ, එතුමාණෝ විපාක දෙන සේක. දිනාගත් දීමනාව ගෙනෙන සේකැයි ජෙරුසලම් වැසියන්ට ප්‍රකාශ කරන්න." ඔව්හු 'ශුද්ධ සෙනග' කියාත්, "සමිඳුන්ගේ මුදාගත් ජනතාව" කියාත් කියනු ලබන්නෝ ය. "දෙවිඳුන්ගේ තෝරාගත් නගරය" කියාත් කියනු ලබන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>පිළිතුරු ගීය</u>**

ගීතාවලිය 97:1,6,11,12

**පිළිතුර :** අද දින පොළොව මත නව ආලෝකයක් බබළන්නේ ය.

**ගීය :** සමිඳාණෝ රජකම් කරන සේක, මිහිතලය ප්‍රීති වේවා !
දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේවා !
දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ කරන්නේය.
සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය නරඹන්නෝ ය.
දැහැමියන් මත එළිය බබළයි. යහපත් අය මත සතුට දිළිසෙයි. පින්වත්නි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙත්වා! එතුමන්ගේ සුවිශුද්ධ භාවය සිහි කොට එතුමන්ට ප්‍රශංසා කරත්වා !

**<u>දෙවන දේව ප්‍රකාශනය</u>** තීතස් 3:4-7

ශුද්ධවූ පාවුළු තුමන් විසින් තීතස්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**ස්වකීය දයානුකම්පාව නිසාම උන්වහන්සේ අප ගැළැවූ සේක.**

එහෙත් අපගේ ගැළවුම්කාර දෙවියන් වහන්සේගේ ගුණවත්කම හා ප්‍රේමය මනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ වූ කල, අප විසින්ම කළ දැහැමි ක්‍රියාවලින් නොව, හුදෙක් ස්වකීය දයාව ලෙස, පුනරුත්පාදනය නමැති ධෝවනයෙන් ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ අලුත් කිරීමෙන් ද උන්වහන්සේ අප ගැළෙව් සේක. උන්වහන්සේගේ වරප්‍රසාදයෙන් අප දමිටු කරනු ලැබ, සදාතන ජීවනයේ බලාපොරොත්තුවට උරුමක්කාරයන් වන පිණිස, උන්වහන්සේ අප ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන ශුද්ධාත්මයාණන් අධික ලෙස අප පිට වැගිරෙව් සේක.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුබුවත් ජය නද</u>** ලූක් 2:14

ආලේලූයා ! ආලේලූයා !
"අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහි පිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා"යි ගැයූහ.
ආලේලූයා !

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 2:15-20

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**එඬේරු මරිය තුමිය ද, ජෝසෙප් ද,**
**ගව ඔරුවක සතප්වා උන් බිළිඳා ද දුටුවෝය.**

තවද, දේව දූතයන් ඔවුන් කෙරෙන් සගලොවට ගිය කල, එඬේරු, "අපි වහාම බෙත්ලෙහෙමට ගොස් සමිඳාණන් වහන්සේ අපට දන්වා වදාළ මේ සිද්ධිය බලමු"යි ඔවුනොවුන් අතර කතා කරගත්හ. ඔව්හු යුහුව ගොස් මරිය තුමීද ජෝසෙප් ද ගව ඔරුවක සතප්වා උන් බිළිඳාද දුටුවෝ ය. ඔව්හු ඒ දැක මේ දරුවා ගැන තමන්ට දන්වන ලද දේ පළ කළහ. ඒ ඇසූ සියල්ලෝ, එඬේරුන් පැවසූ සියල්ල ගැන මවිත වූහ. එහෙත්, මරිය තුමී එකී සියල්ල සිත්හි නිදන් කොට ඒවා මෙනෙහි කළාය. එඬේරු ද තමන්ට දන්වන ලද ලෙස ම ඇසූ දුටු සියල්ල ගැන දෙවියන් වහන්සේට ගෞරව කරමින් ද ප්‍රශංසා කරමින් ද පෙරළා ගියහ.

සමිඳුණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.